දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

භූවිප්‍ර 1.1 - මානව භූගෝල විද්‍යාව
GY 1.1 – Human Geography

කාලය පැය (03) තුන යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. මානව භූගෝල විද්‍යා ක්ෂේත්‍රය විවිධ සම්ප්‍රදායන්, සංකල්ප න්‍යායන් මත වර්ධනය වී ඇති ආකාරය සුදුසු උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

02. ලෝක ජන සංඛ්‍යා වර්ධනය සමග පැනනැගී ඇති පාරිසරික අර්බුධ මොනවාදැයි කෙටියෙන් විග්‍රහ කොට, එක් පාරිසරික අර්බුදයකට තුඩු දී ඇති හේතු සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇසුරින් පැහැදිලි නරන්න.

(ලකුණු 20)

03. නිවර්තන කළාපීය රටවල ව්‍යාපාරික වතු කෘෂිකර්මයේ විකාශය, ව්‍යාප්තිය එහි නව ප්‍රවනතා පිළිබඳ හේතුසාධක සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. (i) සංක්‍රමණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

(ii) මානව සංක්‍රමණයේ විකාශණය, සංක්‍රමණ රටා හා ප්‍රවනතා පිළිබඳව උදාහරණ සහිතව විමර්ශනය කරන්න.

(ලකුණු 15)

05. (i) සංවර්ධනය යන්න අර්ථ දක්වන්න.

(ලකුණු 03)

(ii) මානව සංවර්ධන දර්ශකය (Human Development Index) මිනුම් කරන අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) ලෝකයේ රටවල් අතර සංවර්ධන විෂමතා පෙන්නුම් කිරීමෙහි ලා මානව සංවර්ධන දර්ශකයෙහි දායකත්වය උචිත දත්ත හා නිදසුන් ඇසුරින් විමසන්න

(ලකුණු 12)

06. (i) තිරසර සංවර්ධන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේදී ලෝකයේ රටවල් විසින් අනුගමනය කළ යුතු උපාය මාර්ග නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

07. (i) මානව කාරක පරිසර හායනය යනු කුමකුදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) මානව කාරක පරිසර හායනය වැලැක්වීමෙහිලා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 12)

08. (i) ගෝලීයකරණය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 15)